# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.04 පැය 1145 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/15/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. 2025.01.03 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 60 | 110 | තඹ දඟර 03<br>යකඩ බැරල් 02<br>ප්ලාස්ටික් බැරල් 01<br>ප්ලාස්ටික් බූලි 03<br>බට 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුර.**

2025.01.03 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දෙමටගොඩ පොලිස් වසමේ මිහිඳුසෙන්පුර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලි ග්‍රෑම් 12 ක්, හෙරොයින් ග්‍රෑම් 16 මිලි ග්‍රෑම් 42 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන දෙමටගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කිරුළපන ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

දෙමටගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2025.01.03 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ජා ඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 950 ක්, මත්ද්‍රව්‍ය

අලෙවියෙන් උපයාගත් බවට සැක කල හැකි මුදල් රුපියල් 14,000/= ක් ඩිජිටල් තරාදි 01 ක් හා ජංගම දුරකථන 01 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ජාඇල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන ඒකල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ජාඇල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

2025.01.03 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගෝමරන්කඩවල පොලිස් වසමේ පඹුරුගස්හින්න රක්ෂිත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවි දෙකක් සමඟ සැකකරුවන් දෙදෙනෙක් අත්අඩංගුවට ගෙන ගෝමරන්කඩවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 46 හා 48 වයස් වල පසුවන ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

ගෝමරන්කඩවල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**